## දැන්වීමයි.

## බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ
## ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

**(විවෘත බඳවා ගැනීම)**

බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ උපස්ථායක/උපස්ථායිකා හා ඖෂධ සංයෝජක යන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- වැටුප් පරිමාණය :

  ඒකාබද්ධ වැටුප - PL 2 – 2016

  රු.25,250 - 10×270 - 10×300 - 10×330 - 12×350 - රු. 38,450

  (රා.ප.ච. අංක:03/2016 හා උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

**01. බඳවා ගැනීමේ මූලික සුදුසුකම්:**

- අධ්‍යාපන සුදුසුකම් :

  අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත්වී තිබීම. (අවම වශයෙන් විෂයන් 05 ක් එකවර සමත්වී තිබිය යුතුය.)

- වෘත්තීය සුදුසුකම් :

  තනතුරට අදාලව රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස හයකට (06) නොඅඩු කාලසීමාවක පුහුණුවක් ලබා තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.)

- පළපුරුද්ද :

  අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පලපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

- කායික සුදුසුකම් :

  බස්නාහිර පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**02. වෙනත් සුදුසුකම් :**

අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි (බඳවා ගන්නා දිනට වයස අවුරුදු 45 ඉක්මවා තිබීම අයදුම්කරු නුසුදුස්සෙකු වීමට හේතු වේ.) පූර්වාසන්න වසර 3 තුල බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන **2019.07.29** වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතික වල සහතික කරන ලද පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.